" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/05-2023 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.07. 26 |
|---|---|---|---|---|---|

**පාලන චක්‍රලේඛ : 04/2023**

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),

ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),

සභා ලේකම් (බ.ප.),

ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),

පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),

ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),

අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**<u>ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම.</u>**

උක්ත ශීර්ෂය යටතේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම් විසින් 2022.06.22 දිනෙන් යුතුව නිකුත් කරන ලද අංක 14/2022 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ද, 2022.09.06 දිනෙන් යුතුව නිකුත් කරන ලද අංක 14/2022(I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයටද අදාළව, 2023.07.13 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022(III) චක්‍රලේඛය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයට අදාළ කර ගැනීමට 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වගන්තිය යටතේ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා දෙන ලදි. එම අනුමැතිය මගේ අංක CSWP/ADM/18-38/FI/01-2023 හා 2023.07.31 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත.

02. අංක 09/2022 හා 2022.08.03 දිනැති පාලන චක්‍රලේඛය ද, අංක 09/2022(I) හා 2022.10.10 දිනැති පාලන චක්‍රලේඛය සහ අංක 10/2022 හා 2022.10.10 දිනැති පාලන චක්‍රලේඛය යටතේ ඉදිරිපත් කරන ලද ගිවිසුමේ පළමු ඡේදයේ "ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොමැතිව" යන්න පමණක් සංශෝධනය කරන බව කාරුණිකව දන්වා සිටින අතර, එම චක්‍රලේඛයන් අවස්ථාවෝචිතව පරිදි අදාළ විය යුතුය.

03. ඒ අනුව, කරුණාට අදාළව පාලන චක්‍රලේඛ 09/2022(I) සමඟ යොමු කර ඇති විදේශීය නිවාඩු සඳහා ගිවිසුම් ආකෘතිය වෙනුවට මේ සමඟ ඇමුණුම 1 යටතේ ඉදිරිපත් කරන විදේශිය නිවාඩු ගිවිසුම් ආකෘතිය පරිදි සහ පාලන චක්‍රලේඛ 10/2022 සමඟ යොමු කර ඇති දේශීය නිවාඩු සඳහා ගිවිසුම් ආකෘතිය වෙනුවට මේ සමඟ ඇමුණුම 2 යටතේ ඉදිරිපත් කරන දේශීය නිවාඩු ගිවිසුම් ආකෘතිය පරිදි නිවාඩු අනුමත කරනු ලබන බලධාරීත්වය සහ නිවාඩු ඉල්ලුම්කරු ගිවිසුම්ගත විය යුතු බව වැඩිදුරටත් දන්වමි.

04. තවද, පාලන චක්‍රලේඛ අංක 10/2022(I) හා 10/2022(II) යටතේ යොමු කරන ලද දේශීය නිවාඩු ලබා ගැනීමට සකස් කරන ලද අයදුම්පත්‍රය වෙනුවට මේ සමඟ ඇමුණුම 3 යටතේ ඉදිරිපත් කර ඇති දේශීය නිවාඩු ලබා ගැනීමේ අයදුම්පත්‍රය මින් ඉදිරියට දේශීය නිවාඩු ලබාගැනීමට ඉල්ලුම් කිරීමේදී යොදා ගන්නා ලෙස තවදුරටත් දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

# **ගිවිසුමයි.**

මෙහි පහත ඇතැම් තැනක ''පළමු පාර්ශවය'' ලෙස හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ ...........................................................................................................…. (ප්‍රධාන ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම්) වන .............................................. යන අය (අනුප්‍රාප්තිකව එම තනතුරට ස්ථිරව හෝ වැඩ බැලීම සඳහා පත්වන අය ද සමග) එක් පක්ෂයකට ද, මෙහි ඇතැම් තැනක ''දෙවන පාර්ශවය'' ලෙස හඳුන්වනු ලබන ................................................ (අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම) සේවය කරන බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ........................................................................................................ තනතුරක් දරන ....................................................................................................................................... යන ලිපිනය ඇති ................................................ යන අය අනෙක් පාර්ශවය වශයෙන් ද ඇති කරගන්නට යෙදෙන ගිවිසුමයි.

ඉහත කී දෙවන පාර්ශවය විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක EST-6/03/LEA/3162(1) දරන 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/2022 චක්‍රලේඛය ද, 2022.09.06 දිනැති 14/2022 (I) චක්‍රලේඛය ද, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක: EST-6/03/LEA/3162(4) දරන 2023.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/2022 (III) දරන චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට අනුකූලව කරනු ලබන ඉල්ලීමක දී , වැටුප් රහිත නිවාඩු ලබා දීමට පළමු පාර්ශවය එකඟ වන හෙයින් විදේශ නිවාඩු කාල සීමාව තුළ ඉහත කී එකී පළමු පාර්ශවය හා දෙවන පාර්ශවය ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/2022, 14/2022 (I) හා 14/2022 (III) දරන චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට අනුකූලව දෙපාර්ශවය අතර කටයුතු පවත්වාගෙන යාම පිළිබඳව එකී දෙපාර්ශවය විසින් පහත කොන්දේසි සහ බැඳීම්වලට යටත්ව මෙම ගිවිසුමට ඇතුළත් වේ.

**ඉහත කී කොන්දේසි සහ බැඳීම් කවරේද යත්;**

1. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක: අංක EST-6/03/LEA/3162(1) දරන 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/2022 චක්‍රලේඛය ද, 2022.09.06 දිනැති 14/2022 (I) චක්‍රලේඛය ද , රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක: EST6/03/LEA/3162(4) දරන 2023.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/2022(III) දරන චක්‍රලේඛයන්හි විධිවිධාන (මෙහි මින් මතු රා.ප.ච.අංක: 14/2022, 14/2022(I) හා 14/2022 (III) යනුවෙන් හඳුන්වන) මෙම

ගිවිසුමෙහි කොටසක් වශයෙන් පිළිගනිමින් එකී චක්‍රලේඛයන්හි කොන්දේසි හා නියමයන්ට අනුකූලව මෙම ගිවිසුම තුළ එකඟ වන නිවාඩු කාලසීමාව තුළ කටයුතු කිරීමට දෙපාර්ශවයම එකඟ වෙයි.

2. රා.ප.ච.අංක: 14/2022, 14/2022 (I) හා 14/2022 (III) චක්‍රලේඛ යටතේ දෙවන පාර්ශවය විසින් විදේශ නිවාඩු අයදුම් කිරීමේ දී සහ පළමු පාර්ශවය විසින් ඊට අදාළ විදේශ නිවාඩු අනුමත කිරීමේ දී රා.ප.ච.අංක: 14/2022, 14/2022 (I) හා 14/2022 (III) චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධාන, ඊට අදාළ රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටි රීති මඟින් නියම කරන විධිවිධාන හා සමාන්තරව ක්‍රියාත්මක විය යුතු බව දෙපාර්ශවය පිළිගනියි.

3. පළමු පාර්ශවය දෙවන පාර්ශවය වෙත රා.ප.ච.අංක: 14/2022 චක්‍රලේඛය යටතේ විදේශ නිවාඩු අනුමත කිරීමේ දී, එම චක්‍රලේඛයෙහි 02 සහ 03 ඡේද අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුතු බව ද දෙපාර්ශවය පිළිගනියි.

4. රා.ප.ච.අංක: 14/2022, 14/2022 (I) හා 14/2022 (III) චක්‍රලේඛ යටතේ අනුමත විදේශ නිවාඩු කාල සීමාව තුළ එම චක්‍රලේඛ වල සඳහන් උපදෙස් හා නියමයන්ට යටත් වන බවට සහ ඊට යටත්ව සෑම විටම ක්‍රියා කරන බවට දෙවන පාර්ශවය එකඟ වේ.

5. දෙවන පාර්ශවය විසින් මෙම ගිවිසුමට අදාළ විදේශ නිවාඩු කාල සීමාව තුළ රා.ප.ච.අංක: 14/2022, 14/2022 (I) හා 14/2022 (III) චක්‍රලේඛයන්හි උපදෙස්, කොන්දේසි හෝ නියමයන් නොසලකා හරිමින් හෝ පැහැර හරිමින් හෝ කඩකරමින් කටයුතු කර ඇති බව තහවුරු වන කවර හෝ අවස්ථාවක දෙවන පාර්ශවයට අදාළ රා.ප.ච.අංක: 14/2022, 14/2022 (I) හා 14/2022 (III) චක්‍රලේඛ යටතේ හිමි වූ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවය තුල, එම චක්‍රලේඛ යටතේ හිමිවූ වෙනත් කවර හෝ හිමිකමක් සඳහා අයිතිවාසිකමක් නොමැති බව දෙවන පාර්ශවය පිළිගනියි.

6. දෙවන පාර්ශවයට විදේශ නිවාඩු කාල සීමාව තුළ රටින් බැහැරව සිටින කාල සීමාවේ දී රා.ප.ච.අංක: 14/2022, 14/2022 (I) හා 14/2022 (III) චක්‍රලේඛයන් අනුව නිවාඩු අනුමත කරනු ලබන දිනට හිමි මූලික වැටුපට අදාළ වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත විදේශ මුදලින් ප්‍රේෂණය කිරීමේ දී ඊට අදාළ තහවුරුවක් පළමු පාර්ශවයට යොමු කිරීමට දෙවන පාර්ශවය එකඟ වන අතර, ඒ හා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් කලින් කල ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීමට දෙවන පාර්ශවය එකඟ වෙයි.

ඉහත කී කොන්දේසීන්ට යටත් පහත නම් සඳහන් සාක්ෂිකරුවන් ඉදිරියේ ඉහත කී දෙපාර්ශවය විසින් මෙම ගිවිසුමට හා මේ හා සමාන තවත් ගිවිසුමකට වර්ෂ ................ ක් වූ .............................. මස ............දින ........................... දී අත්සන් තබන ලදී.

**පළමු පාර්ශවය වෙනුවෙන්**

අත්සන : ……………………………………….

නම : …………………………………………………………………………

ලිපිනය : …………………………………………………………………………

ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

නිල මුද්‍රව

**දෙවන පාර්ශවය වෙනුවෙන්**

අත්සන : ……………………………………….

නම : …………………………………………………………………………

ලිපිනය : …………………………………………………………………………

ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

**සාක්ෂි :**

1. අත්සන :

   නම :

   ලිපිනය :

   ජාතික හැඳුනුම්පත් අංකය :

2. අත්සන :

   නම :

   ලිපිනය :

   ජාතික හැඳුනුම්පත් අංකය :

ගිවිසුමයි.

මෙහි පහත ඇතැම් තැනක "පළමු පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ ............................................................................................................ (ප්‍රධාන ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම්) වන ............................................. යන අය (අනුප්‍රාප්තිකව එම තනතුරට ස්ථිරව හෝ වැඩ බැලීම සඳහා පත්වන අය ද සමග) එක් පක්ෂයකට ද, මෙහි ඇතැම් තැනක "දෙවන පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන .................................................. (අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම) සේවය කරන බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ..................................................................................................... තනතුරක් දරන ..................................................................................................................................... යන ලිපිනය ඇති .................................................. යන අය අනෙක් පාර්ශවය වශයෙන් ද ඇති කරගන්නට යෙදෙන ගිවිසුමයි.

ඉහත කී දෙවන පාර්ශවය විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක: EST-6/03/LEA/3162(1) දරන 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/2022 චක්‍රලේඛය ද, 2022.09.06 දිනැති 14/2022 (I) චක්‍රලේඛය ද, 2022.09.15 දිනැති 14/2022 (II) චක්‍රලේඛයෙහි ද රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක: EST-6/03/LEA/3162(4) දරන 2023.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/2022 (III) දරන චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධාන ප්‍රකාරව දේශීය වැටුප් රහිත නිවාඩු පළමු පාර්ශවය වෙතින් ඉල්ලුම් කිරීමට අපේක්ෂා කර ඇති හෙයින් ද, එකී පළමු පාර්ශවය වෙතින් ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/2022, 14/2022 (I) ,14/2022 (II) හා 14/2022 (III) චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට අනුකූලව කරනු ලබන ඉල්ලීමක දී, වැටුප් රහිත නිවාඩු ලබා දීමට පළමු පාර්ශවය එකඟ වන හෙයින් ද දේශිය නිවාඩු කාල සීමාව තුළ ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/2022, 14/2022 (I) , 14/2022 (II) හා 14/2022 (III) චක්‍රලේඛයන්ට අනුකූලව දෙපාර්ශවය අතර කටයුතු පවත්වාගෙන යාම පිළිබඳව එකී දෙපාර්ශවය විසින් පහත කොන්දේසි සහ බැඳීම්වලට යටත්ව මෙම ගිවිසුමට ඇතුළත් වේ.

ඉහත කී කොන්දේසි සහ බැඳීම් කවරේද යත්;

1. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක: EST-6/03/LEA/3162(1) දරන 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/2022, 2022.09.06 දිනැති 14/2022 (I) චක්‍රලේඛය ද, 2022.09.15 දිනැති 14/2022 (II) චක්‍රලේඛය ද 2023.07.13 දිනැති 14/2022 (III) චක්‍රලේඛයද යන චක්‍රලේඛයන් (මෙහි මින් මතු රා.ප.ච.අංක: 14/2022, 14/2022 (I) , 14/2022 (II) හා 14/2022 (III) යනුවෙන් හඳුන්වන) මෙම ගිවිසුමෙහි

කොටසක් වශයෙන් පිළිගනිමින් එකී චක්‍රලේඛයන්හි කොන්දේසි හා නියමයන්ට අනුකූලව මෙම ගිවිසුම තුළ එකඟ වන නිවාඩු කාලසීමාව තුළ කටයුතු කිරීමට දෙපාර්ශවයම එකඟ වෙයි.

2. රා.ප.ච. අංක: 14/2022, 14/2022 (I) , 14/2022 (II) හා 14/2022 (III) චක්‍රලේඛයන් යටතේ දෙවන පාර්ශවය විසින් දේශීය නිවාඩු අයදුම් කිරීමේ දී සහ පළමු පාර්ශවය විසින් ඊට අදාළ දේශීය නිවාඩු අනුමත කිරීමේ දී රා.ප.ච.අංක: 14/2022, 14/2022 (I) , 14/2022 (II) හා 14/2022 (III) චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධාන, ඊට අදාළ රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටි රීති මඟින් නියම කරන විධිවිධාන හා සමාන්තරව ක්‍රියාත්මක විය යුතු බව දෙපාර්ශවය පිළිගනියි.

3. පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (II) යටතේ දේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමේ දී, ඉහත කී දෙවන පාර්ශවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (II) හි 3.3 ඡේදයට අනුව, අදාළ චක්‍රලේඛය යටතේ වැටුප් රහිත නිවාඩු සඳහා හිමිකම් ඇති සේවකයන් හා තනතුරු දරන අයෙකු වන්නේ ද යන්න පිළිබඳව හඳුනාගැනීමට පත් කරන කමිටුව විසින් තෝරා ගත් පාර්ශවයක් බව දෙපාර්ශවය පිළිගනී.

4. රා.ප.ච.අංක:14/2022, 14/2022 (I) , 14/2022 (II) හා 14/2022 (III) යටතේ අනුමත දේශීය නිවාඩු කාල සීමාව තුළ එම චක්‍රලේඛයන්හි උපදෙස් හා නියමයන්ට යටත් වන බවට හා ඊට යටත්ව සෑම විටම ක්‍රියා කිරීමට දෙවන පාර්ශවය එකඟ වේ.

5. දෙවන පාර්ශවය විසින් මෙම ගිවිසුමට අදාළ දේශීය නිවාඩු කාල සීමාව තුළ රා.ප.ච.අංක:14/2022 14/2022 (I) , 14/2022 (II) හා 14/2022 (III) චක්‍රලේඛයන්හි උපදෙස්, කොන්දේසි හෝ නියමයන් නොසලකා හරිමින් හෝ පැහැර හරිමින් හෝ කඩකරමින් කටයුතු කර ඇති බව තහවුරු වන කවර හෝ අවස්ථාවක දෙවන පාර්ශවයට අදාළ රා.ප.ච. අංක:14/2022, 14/2022 (I) , 14/2022 (II) හා 14/2022 (III) යන චක්‍රලේඛයන් යටතේ හිමි වූ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන කවර හෝ හිමිකමක් සඳහා තමන්ට අයිතිවාසිකමක් නොමැති බව දෙවන පාර්ශවය පිළිගනියි.

6. දෙවන පාර්ශවය දේශීය නිවාඩු කාල සීමාව තුළ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන් බැහැරව සිටින කාල සීමාවේ දී රා.ප.ච.අංක:14/2022, 14/2022 (I) , 14/2022 (II) හා 14/2022(III) චක්‍රලේඛයන්ට අනුකූලව කටයුතු කිරීමට දෙවන පාර්ශවය එකඟ වෙයි.

ඉහත කී කොන්දේසීන්ට යටත්ව පහත නම් සඳහන් සාක්ෂිකරුවන් ඉදිරියේ ඉහත කී දෙපාර්ශවය විසින් මෙම ගිවිසුමට හා මේ හා සමාන තවත් ගිවිසුමකට වර්ෂ ................ ක් වූ ............................. මස ...........දින ........................... දී අත්සන් තබන ලදී.

**පළමු පාර්ශවය වෙනුවෙන්**

අත්සන : ……………………………………

නම : ……………………………………………………………………

ලිපිනය : ……………………………………………………………………

ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

නිල මුද්‍රව

**දෙවන පාර්ශවය වෙනුවෙන්**

අත්සන : ……………………………………

නම : ……………………………………………………………………

ලිපිනය : ……………………………………………………………………

ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................................................

**සාක්ෂි :**

1. අත්සන :
   නම :
   ලිපිනය :
   ජාතික හැඳුනුම්පත් අංකය :

2. අත්සන :
   නම :
   ලිපිනය :
   ජාතික හැඳුනුම්පත් අංකය :

**රා.ප.ච. 14/2022(II), 14/2022(III) හා බ.ප.පාලන චක්‍රලේඛ 10/2022 අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් දේශීය නිවාඩු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල යුතු අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) - ........................................................................................................

02. සම්පූර්ණ නම - .......................................................................................................................

.......................................................................................................................................

03. තනතුර හා ශ්‍රේණිය - ...............................................................................................................

04. උපන් දිනය - ................................................ වයස - ...................................................

05. ජා.හැ.අංකය- ......................................................

06. පෞද්ගලික ලිපිනය - ...............................................................................................................

.......................................................................................................................................

07. පෞද්ගලික දුරකථන අංකය - ජංගම.................................... ස්ථාවර.......................................

08. කාර්යාලයේ ලිපිනය - ..............................................................................................................

09. කාර්යාලයේ දුරකථන අංකය -....................................................

10. නිවාඩු ඉල්ලුම් කිරීමේ හේතුව (රාප.ච.14/2022(II) 4.1 වගන්තිය අනුව) -...............................................

.......................................................................................................................................

11. නිවාඩු ඉල්ලුම් කරන කාලසීමාව - ..............................................................................................

12. දේශීය නිවාඩු ලබා සිටින කාලය තුල රාජකාරි ආවරණය/ වැඩ බැලීම සඳහා යොදා ඇති,

i. නිලධාරියාගේ නම -.......................................................................................

ii. තනතුර - ...............................................................................................

............................................. .................................

දිනය අයදුම්කරුගේ අත්සන

---

ආයතනයේ යොමු අංකය-................................

දෙපාර්තමේන්තු ප්‍රධානී,

.......................................

13. මෙම අයදුම්පත්‍රයේ ඉහත සඳහන් තොරතුරු නිවැරදිය.

14. අයදුම්කරුගේ මුල් පත්වීමේ දිනය- ..........................................................

15. අයදුම්කරුගේ සේවය ස්ථිර කර ඇතිද යන වග - ඇත/නැත

ස්ථිර කර ඇති නම් ස්ථිර වූ දිනය-.......................................................

16. අයදුම්කරු මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙක්ද - ඔව්/නැත

.............................. .......................................

දිනය ස.ලේකම්./පරිපාලන නිලධාරී

---

ආයතනයේ යොමු අංකය-.................................

අමාත්‍යංශ ලේකම්/ස.ප්‍ර.ලේ.(පාලන),

......................................................

17. i. අයදුම්කරු අත්තිකාරම් 'බී' ගිණුමෙන් ණය ලබා ගෙන ඇත/නැත.ලබාගෙනඇතිනම්,

එම ණය..................... දිනැති ලදුපත් අංක .............. මඟින් සම්පූර්ණයෙන් ගෙවා නිම කර ඇත.

ii. පෞද්ගලික බැංකු ණය/ ආපදා ණය වැටුපෙන් අයකිරීම සඳහා ගණකාධිකාරී/ මූල්‍ය නිලධාරියකු විසින්, බැංකුව වෙත එකඟතා ආකෘති පත්‍රයක් අත්සන් කර ඇත/නැත.

iii. වෙනත් ණය (රාජ්‍ය නිලධාරින්ගේ සංගම්/ලෝහෝර් ආර්යා ණය අරමුදල වැනි) සඳහා වැටුපෙන් අය කිරීමට එකඟතා ආකෘති පත්‍රයක් අත්සන් කර ඇත/නැත.

.............................. ................................................

දිනය ගණකාධිකාරී/මූල්‍ය අංශ ප්‍රධානී

ආයතනයේ යොමු අංකය-..................................

අමාත්‍යාංශ ලේකම්/ස.ප්‍ර.ලේ.(පාලන)

.....................................................

18. රාජකාරි ආවරණය කරනු ලබන නිලධාරියා ඒ සඳහා කැමැත්ත ප්‍රකාශිත ලිපියක් අමුණා ඇත/නැත

19. මෙම අයදුම්කරුට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ගයක් දැනට පවතින/නොපවතින බවත්, එසේ විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට ඉදිරියේදී අදහස් කර ඇති/නොමැති බවත් සහතික කරමි.

20. අයදුම්කරු කිසියම් විශේෂිත වූ ගිවිසුම් සඳහා බැඳීමක් ඇත/නැත

"ඇත" නම් ඒ පිළිබඳ විස්තර

..........................................................................................................................................................

21. ඉහත 17.ii හි "ඇත" යනුවෙන් සඳහන් වන්නේ නම්, ඉතිරි ණය ශේෂය අය කිරීමට අදාල නිලධාරියා විසින් බැංකුවට යෝජිත ක්‍රමවේදයට බැංකුව විසින් එකඟතාවය ලබා දුන් ලිපියක් ලබා ගෙන එය ඉදිරිපත් කර ඇත/නැත

22. මෙම නිවාඩු ඉල්ලීම නිර්දේශ කරමි/නොකරමි.

23. නිර්දේශ නොකරන්නේ නම් ඒ සඳහා හේතු

..........................................................................................................................................................

................................. ......................................

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියා

ආයතනයේ යොමු අංකය-..................................

ප්‍රධාන ලේකම්/අමාත්‍යාංශ ලේකම්

................................................

24. උක්ත නම් සඳහන් නිලධාරියා/නිලධාරිනිය ගේ ..................................දින සිට.................................. දින දක්වා වන වැටුප් රහිත දේශීය නිවාඩුව ................................... දිනපැවති ඊට අදාලව පත් කර ඇති කමිටුව විසින් නිර්දේශ කරඇත.

................................ ......................................

දිනය කමිටු සභාපති

25. උක්ත නම් සඳහන් නිලධාරියා/නිලධාරිනිය ගේ ............................. දින සිට .................................දින දක්වා වන කාලපරිච්ඡේදය සඳහා වන දේශීය නිවාඩු ඉල්ලීම අනුමත කරමි/නොකරමි.

.................................. ................................................

දිනය අමාත්‍යාංශ ලේකම්/ප්‍රධාන ලේකම්